**සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2021**
**----------------------------------------------------------------------------------------------------**

සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවේ ("සමාගම") 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 2007 අංක 07 දරන සමාගම් පනත සමග කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2007 අංක 07 දරන සමාගම් පනතේ 150(1) වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු 2018 වර්ෂයේ සිට 2022 දක්වා වූ මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 25 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

සමාගමේ මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (SLFRS for SMEs) සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම මණ්ඩලයේ වගකීම වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් නොකිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැතිව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 6.5.1 වගන්තිය පරිදි ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60ක් ඇතුළත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් සීමාසහිත ලංකා ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව විසින් 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වූ වර්ෂයන්ට අදාළ මූල්‍ය ප්‍රකාශන 2023 මාර්තු 25 දින වන විටත් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.<br><br>සමාගම විසින් භාවිතා කරනු ලැබූ පරිගණක සර්වර් යන්ත්‍රය 2019 වර්ෂයේ දී වෛරස් ආක්‍රමණයක් හේතුවෙන් අක්‍රීය වූ බවත් එම අවස්ථාවේ දත්ත උපස්ථ (Backups)වල ගබඩා කර නොතැබීම හේතුවෙන් ගිණුම් පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු නොමැති බව දක්වමින් මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර නොතිබුණි. 2022 අප්‍රේල් 19 දින පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග මත මේ සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 28 දින අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පැමිණිල්ලක් කර තිබුණද එහි වර්තමාන තත්ත්වය පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දැක්වීම් ඉදිරිපත් කර නොතිබුණි. | චක්‍රලේඛය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය ඉකුත් වී දින 60ක් ඇතුළත විගණනය සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු බව. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 අභ්‍යන්තර පාලනය

සමාගමෙහි ගැනුම්, විකුණුම් ක්ෂේත්‍රයන්හි අභ්‍යන්තර පාලන පද්ධතීන් ඉතා දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණ විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

### 2.1.1 භාණ්ඩ මිලදී ගැනුම් සහ විකුණුම්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 වර්ෂය තුලදී සමාගම විසින් රු.2,052,508,630ක වටිනාකමකින් යුත් යකඩ, සිමෙන්ති, ඇස්බැස්ටස්, උළු හා අනෙකුත් අමුද්‍රව්‍ය මිලදී ගෙන තිබුණු නමුත් එම මිලදී ගැනීම් සිදු කිරීමේදී ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල ගණන් කැඳවා මිලදී ගැනීම ඇතුලු අනෙකුත් නිසි ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ආයතනය සඳහා මිලදී ගැනීම් සිදුකිරීමේදී 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කළ යුතු බව. |
| (ආ) | භාණ්ඩ මිලදී ගැනීමේ නිවැරදිභාවය තහවුරු කර ගැනීම සඳහා අදාළ ගෙවීම් වවුචරය සමග භාණ්ඩ ඇනවුම්, භාණ්ඩ ලැබීම් පත්‍ර ආදී මූලික සාක්ෂි අමුණා තැබිය යුතු වුවත් ගෙවීම්වල නිවැරදිභාවය තහවුරුකර ගැනීම සඳහා එම ලේඛන වවුචර්වලට අමුණා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගෙවීම් නිවැරදිබව තහවුරු කර ගැනීම සඳහා ගෙවීමට අදාල මූලික උපකාරක ලියවිලි සියල්ල වවුචරයට අමුණා තිබිය යුතු බව. |
| (ඇ) | ගැණුම් ඇනවුම්වලට අනුව සහ සැපයුම්කරුවන්ගේ ඉන්වොයිසිවල සඳහන් නිවැරදි භාණ්ඩ ප්‍රමාණයන් හා නියමිත ප්‍රමිතයන්ට අනුව භාණ්ඩ වර්ග නොලැබෙන අවස්ථාවලදී වහාම එම භාණ්ඩ ප්‍රතික්ෂේප කළ යුතුවේ. එසේ වුවද නියැදි පරීක්ෂාවකට අනුව සංසරාජ මාවත අංක 05 ගබඩාවට සහ ප්‍රදර්ශනාගාරයට මිලදීගත් භාණ්ඩ භාර ගැනීමේදී ප්‍රතික්ෂේප කරන ලද භාණ්ඩ සඳහා ගෙවා තිබූ වටිනාකම රු.1,446,908ක් වී තිබුණි. එම භාණ්ඩ සඳහා වෙනත් භාණ්ඩ ලබා ගැනීම හෝ වැඩියෙන් ගෙවූ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රතික්ෂේප කළ යුතු භාණ්ඩ සඳහා පිරිවැය අඩුකිරීමෙන් පසුව මිලදී ගැණුම් සඳහා ගෙවීම් කිරීමට කටයුතු කළයුතු බව. |
| (ඈ) | 2021 වර්ෂයේ ණයට විකුණුම් හා අත්පිට විකුණුම් සම්බන්ධ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට 2023 පෙබරවාරි 28 දින දක්වාම කටයුතු කර නොතිබුණි. ප්‍රාදේශීය විකුණුම් මධ්‍යස්ථානයන්හි විකුණුම් ඉන්වොයිස් නිසි වේලාවට ප්‍රධාන | අදහස් දක්වා නොමැත. | ප්‍රාදේශීය විකුණුම්ද පරිගණක පද්ධතියට වහාම ඇතුළත් කළ හැකිවන පරිදි යහපත් හා ප්‍රමාණවත් අභ්‍යන්තර |

| | | | |
|---|---|---|---|
| | කාර්යාලයට ගෙන්වා ගැනීමේ ක්‍රමවේදයක් හෝ ප්‍රාදේශීය කාර්යාල මඟින් පරිගණක පද්ධතියට තොරතුරු ඇතුළත් කිරීමේ ක්‍රමවේදයක් සහිත අභ්‍යන්තර පාලනයක් හඳුන්වා නොදීම මේ සඳහා හේතුවී තිබුණු බව නිරීක්ෂණය විය. | | පාලන ක්‍රමවේද හඳුන්වා දිය යුතු බව. |
| (ඉ) | සමාගමට භාණ්ඩ මිල කිරීමේ ප්‍රතිපත්තියක් නොමැති වූ අතර 2021 වර්ෂයේ සමාගම විසින් එකම භාණ්ඩ අයිතමය විවිධ මිල ගණන් යටතේ ගැණුම්කරුවන් වෙත විකුණා තිබුණු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | සමාගමේ ගොඩනැගිලි ද්‍රව්‍ය සපයන ප්‍රධාන ආයතනයක් වන බැවින් විධිමත් මිල කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කර ගත යුතු බව. |
| (ඊ) | 2021 වර්ෂයේ රු.84,747,128ක් වටිනා විකුණුම් ඉන්වොයිස් 23ක් හා 2022 වර්ෂයේ රු.79,199,680 ක්වූ විකුණුම් ඉන්වොයිස් 22ක් වශයෙන් එකතුව රු.163,946,808ක් වටිනා විකුණුම් ඉන්වොයිස් 45ක් අවලංගු කර තිබුණි. එසේ වුවද එම ඉන්වොයිස් සඳහා සැපයුම් කිරීමට මිලදීගන්නා ලද භාණ්ඩ සෘජුවම අදාළ වැඩබිම්වලට සපයනු ලබන නිසා අවලංගු කරන ලද විකුණුම් ඉන්වොයිස් සඳහා සැපයීමට ඇනවුම් කරන ලද භාණ්ඩ ලැබුනේද නැද්ද යන්න නිශ්චය කරගත නොහැකි විය. තවද භාණ්ඩ සැපයුවේ නම් එම සපයා තිබූ භාණ්ඩ ඇණවුමේ සඳහන් භාණ්ඩයමද යන්න තහවුරු කෙරෙන සාක්ෂි සහ මෙම ඇනවුම් වෙනුවෙන් මුදල් ගෙවා නොමැති බවට තහවුරු කෙරෙන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවුණි. | අදහස් දක්වා නොමැත. | ඉන්වොයිස් අවලංගු කළද ද්‍රව්‍ය සපයා තිබේද යන්න පිළිබඳ මනා අධීක්ෂණයක් පවත්වාගත යුතු බව. |

## 2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

| | **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | 2021 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු සහ ගෙවිය යුතු ශේෂ සම්බන්ධයෙන් තහවුරු කිරීම් සහ යාවත්කාලීන කරන ලද කාල විශ්ලේෂණයන් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2022 පෙබරවාරි 28 දිනට ලැබිය යුතු ශේෂ එකතුව රු. 900,230,005 ක් සහ බාහිර පාර්ශවයන්ට නිරවුල් කළ යුතු බැරකම් ශේෂ එකතුව රු. 2,715,100,080 ක් වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | සමාගමේ අඛණ්ඩ පැවැත්මට අහිතකර වන බැවින් ලැබිය යුතු හා ගෙවිය යුතු ශේෂයන් තහවුරු කර ගැනීමට සහ කඩිනමින් නිරවුල් කර ගැනීමට කළමනාකරණය ක්‍රියාමාර්ග හඳුන්වා දිය යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2004 ජනවාරි සිට 2013 දෙසැම්බර් දක්වා සේවක අර්ථසාධක අරමුදල් නියමිත පරිදි නොගෙවීම නිසා අධිකරණ නියෝග මත රු.3,982,512ක අධිභාරයක් ගෙවීමට නියමිතව පැවතුණි. එයින් 2021 දෙසැම්බර් 31 දින වන විට මාසිකව රු.50,000 බැගින් එකතුව රු.2,250,000ක් ගෙවා තිබූ අතර තවදුරටත් රු.1,732,512 ක ශේෂයක් ගෙවිය යුතුව පවතින බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | 1958 අංක 15 දරන අර්ථ සාධක අරමුදල් පනත ප්‍රකාර දායක මුදල් සහ අධිභාරයන් නියමිත පරිදි ගෙවීමට කටයුතු කළ යුතු බව. |
| (ඇ) | සමාගම විසින් නියමිත දිනට පෙර එනම් 2006 ජූනි 16 දිනට පෙර ගෙවිය යුතු නිලධාරියෙකුට හිමි පාරිතෝෂික මුදල ගෙවීම ප්‍රමාද වීම හේතුවෙන් අධිකරණ නියෝගයක් මත සමාලෝචිත වර්ෂයේදී රු.79,191ක අධිභාරයක් ගෙවීමට සිදුවී තිබුණි. | අදහස් දක්වා නොමැත. | 1983 අංක 12 දරන පාරිතෝෂික පනතට අනුව අප්‍රමාදව පාරිතෝෂික මුදල් ගෙවීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | 2007 සැප්තැම්බර් 27 දිනැති අමප/07/1625/342/021 දරන අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි කොළඹ 12, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි සී/ස ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාවට අයත් ඉඩමකින් පර්චස් 100ක් වූ බිම් කොටසක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට පැවරීම සඳහා රු. මිලියන 50ක අත්තිකාරම් මුදලක් 2008 පෙබරවාරි 22 දින සමාගම විසින් ලබා ගෙන තිබුණි.<br><br>කෙසේවුවද, 2012 වර්ෂය දක්වා පවරා දීම අවසන් කර නොතිබුණු අතර නැවතත් 2012 මැයි 07 දිනැති අංක 12/0446/540/005 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් 2007 සැප්තැම්බර් 27 දිනැති ඉහත අමාත්‍ය මණ්ඩල තීරණය අවලංගු කර තිබුණි. ඒ අනුව ලබාගත් අත්තිකාරම් මුදල ආපසු ගෙවිය යුතුව තිබුණත් 2023 පෙබරවාරි 28 දින වන විටත් සමාගම විසින් කිසිදු මුදලක් පියවා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ලබාගත් අත්තිකාරම් මුදල ආපසු ගෙවීමට කටයුතු කළ යුතු බව. |

## 2.3 දිගු කාලීන හා කෙටිකාලීන ණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාගැනීමේ අරමුණින් සමාගම විසින් රුපියල් මිලියන 150ක කෙටිකාලීන ණය මුදලක් 2017 මාර්තු 02 දින සිට 2018 අප්‍රේල් 10 දින දක්වා වූ කාලපරිච්ඡේදය තුළ අවස්ථා 03කදී මහජන බැංකුවෙන් ලබා ගෙන තිබුණි. ණය ගිවිසුමේ ඇතුලත් කොන්දේසි අංක 07 ප්‍රකාරව ලබා ගත් ණය, අපේක්ෂිත අරමුණට යොදාගත් බව තහවුරු කලයුතු වුවත් මෙම ණය මුදල ලබාගැනීමේ අරමුණ නොතකා සමාගමේ පඩිනඩි ගෙවීම් ,ප්‍රසාද දීමනා ගෙවීම් ආදී පරිපාලන වියදම් ද ඇතුළුව වෙනත් වියදම් සඳහා මෙම ණය මුදල වැය කර තිබුණු බව නිරීක්ෂණය විය.<br><br>කෙසේ වුවද මෙම ණය මුදල නියමිත පරිදි පියවීමට සමාගම අපොහොසත් වී තිබුණු බැවින් 2021 ජූලි 13 දිනට ගෙවිය යුතු ණය මුදල සහ උපචිත වූ පොලියද සමග මුළු හිඟ මුදල රු.185,336,680ක් වූ අතර ඒ වෙනුවෙන් ගෙවිය යුතු දඩමුදල රු.14,463,658ක් බවද නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ඇතිකරගත් ණය ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව ණය මුදල් උපයෝජනය කර ණය පියවීමට ක්‍රියා නොකිරීම සම්බන්ධයෙන් කළමනාකරණය වගකිව යුතු බව. |
| (ආ) | මූල්‍ය දුෂ්කරතා ජයගනිමින් ඉදිකිරීම් කර්මාන්තයේ ශක්තිමත් පාර්ශවකරුවකු වීමට සමාගමට හැකි වනු පිණිස භාණ්ඩාගාර ඇපයක් මත 2018 මාර්තු 28 දිනැති හා අංක අමප/18/0504/736/00 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත ලංකා බැංකුව විසින් රුපියල් මිලියන 500ක ණය මුදලක් 2018 ඔක්තෝබර් 23 දින සමාගම වෙත ලබා දී තිබුණි. එයින් එදින වන විට ලංකා බැංකුවට අයවීමට තිබූ රු.199,052,329 ක් වූ මුදලක් අඩුකර ගෙන ඉතිරි මුදල රු.301,377,920 ක් ආයතනයට ලබා දී තිබුණි. එයින් සියයට 35 ක් පමණ මුදලක් එනම් රු.105,977,098ක් ණය ලබා ගැනීමේ අරමුණට පටහැනිවූ වියදම් වූ සේවක වැටුප් ගෙවීම්, සේවක අර්ථසාධක / භාරකාර අරමුදල් ගෙවීම්, ණය පොළී ගෙවීම්, ප්‍රසාද දීමනා ගෙවීම්, අයිරා පියවීම, ස්ථාවර වත්කම් මිලදී ගැනීම් වෙනුවෙන් වැය කර තිබුණි. මෙම රු.මි. 500ක ණය මුදලද එකඟ වූ කොන්දේසි අනුව පියවීමට සමාගම අපොහොසත් වී තිබුණු අතර 2021 දෙසැම්බර් 31 දිනට හිඟ ණය පොළී මුදල රු.102,408,283ක් බවද නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | ණය ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව කටයුතු කිරීමට කළමණාකරණය පියවර ගත යුතු බව. |

## 2.4 ප්‍රසම්පාදන කළමණාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගම විසින් භාවිතා කරමින් පවතින මෘදුකාංග පද්ධතිය කාර්යක්ෂම නොවීම හේතුවෙන් නව පරිගණක පද්ධතියක් මිලදී ගැනීම සඳහා සමාලෝචිත වර්ෂයේදී ආයතන 05කින් සීමිත මිල ගණන් කැඳවා තිබුණි. මේ සඳහා වූ පිරිවිතරයන් ආයතනය විසින් පිළියෙල කර තිබුණු නමුත් රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.3 හා 4.3.2 වගන්ති ප්‍රකාරව ආයතනය විසින් මුළු පිරිවැය ඇස්තමේන්තුවක් සකස්කර අනුමැතිය ලබා ගෙන නොතිබුණි. තවද, 5.4.4 ඡේදය ප්‍රකාරව අත්තිකාරම් ගෙවීමේදී සුරක්ෂණයක්ද ලබාගෙන නොතිබුණි. 8.1 වගන්තිය ප්‍රකාරව තාක්ෂණික ඇගයීම් කමිටුවේ වාර්තාව පරීක්ෂාකර බලා ප්‍රසම්පාදන කමිටුව විසින් තීරණය දැනුම්දිය යුතු වුවත් එම වගන්තිවලට අනුකූලතාවයක් නොදක්වා රු. 982,350 ක අත්තිකාරමක් සාමාන්‍යාධිකාරීගේ අනුමැතියෙන් 2021 ඔක්තෝබර් 12 දින ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව ප්‍රසම්පාදනයන් සිදු කළ යුතු බව. |

## 2.5 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සැප්තැම්බර් මාසයේදී ආරම්භ කරන ලද ටයිල් ව්‍යාපෘතිය මඟින් 2022 සැප්තැම්බර් දක්වා රු.2,419,216,903ක විකුණුම් ආදායමක් ලබා තිබුණද, ඒ සඳහා 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ අයකර ගත් එකතු කළ අගය මත බදු රු.55,889,608 ක් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | එකතු කළ අගය මත බදු පනත ප්‍රකාරව අය කර ගත් බදු මුදල් වහාම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාගම සතුව 2021 දෙසැම්බර් 31 දිනට ඉඩම් කැබලි 21ක් පැවති අතර එයින් කොළඹ හා මොරටුව මහ නගරසභාවලට අයත් ඉඩම් හැර සෙසු ඉඩම් සඳහා 2021දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු වරිපනම් බදු මුදල පිළිබඳව තොරතුරු සමාගම සතුව නොතිබුණි. 2022 ඔක්තෝබර් 25 දිනැති කොළඹ මහ නගර සභාවේ නාගරික භාණ්ඩාගාරික දෙපාර්තමේන්තුවේ ගණකාධිකාරි (වරිපනම්) ගේ, අංක නාහා/වරි/සංස්ථා/25/2022 දරණ ලිපියට අනුව සමාගම විසින් 2021 දෙසැම්බර් 31 දිනට කොළඹ මහ නගර සභාවට ගෙවිය යුතු වරිපනම් මුදල් හා දඩ රු. 23,338,598 ක් වී තිබූ අතර ඒ තුළ 2021 වර්ෂයට පෙර වර්ෂ සඳහා ගෙවිය යුතු රු.21,342,758 ක්ද, 2021 වර්ෂය සඳහා ගෙවිය යුතු රු. 1,995,840ක්ද වී තිබුණි.<br><br>තවද මොරටුව මහ නගර සභාව විසින් ඉදිරිපත් කර තිබූ තොරතුරු අනුව 2021 දෙසැම්බර් 31 දිනට මොරටුව මහ නගර සභාව වෙත ගෙවිය යුතු වරිපනම් ශේෂය රු.1,345,806ක් වූ අතර මේ තුල 2021 වර්ෂයට පෙර ගෙවිය යුතු වරිපනම් රු.1,164,771 ක් විය. | අදහස් දක්වා නොමැත. | ගෙවිය යුතු වරිපනම් බදු පිළිබඳ විස්තර අදාළ පළාත් පාලන ආයතන වෙතින් විමසා ගෙවීමට කටයුතු කළ යුතු බව. |

**2.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.3 වගන්තිය | සමාගම විසින් උපයා ගන්නා ලද සාධාරණ අතිරික්තය / ලාභය මත සේවකයින් හට ප්‍රසාද දීමනා ගෙවිය යුතු වුවත් එයට පටහැනිව සමාගම 2021 සඳහා ලාභ ලබා තිබේදැයි නිශ්චය කර ගැනීමකින් තොරව චක්‍රලේඛයෙන් බැහැරව වර්ෂයේ ප්‍රසාද දීමනා වශයෙන් රු. 1,105,000 ක මුදලක් ගෙවා තිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛයට අනුකූලව ලාභ ලබා තිබේනම් පමණක් ප්‍රසාද දීමනා ගෙවිය හැකි බව. |
| (ආ) | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරණ රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 3.2.6 ඡේදය හා 3.2.7 ඡේදය | එක් එක් වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඊළඟ වර්ෂයේ ජුනි 30 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කර ඒ බව ජුනි 30 දිනට පෙර රාජ්‍ය මුදල් අධ්‍යක්ෂකට දැනුම් | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛයට අනුකූලව වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | | දිය යුතු වුවත් ප්‍රධාන කාර්යාලය හා ප්‍රාදේශීය කාර්යාල 16ක 2021 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් භාණ්ඩ සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | | |
| (ඇ) | 2017 ජුනි 28 දිනැති භාණ්ඩාගාර ලේකම් විසින් නිකුත් කරන ලද අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය | සමාගම විසින් 2021 දෙසැම්බර් 31 දිනට කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට ඉදිරිපත් කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු බව. |

**2.7 වාහන උපයෝජනය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ආයතනය සතුව පැවති වාහන 18න් වාහන 09ක් ධාවන තත්ත්වයේ නොපැවතුණි. | අදහස් දක්වා නොමැත. | ආයතනයේ ධාවන තත්ත්වයේ නොපවතින වාහන ධාවනයට සුදුසු තත්ත්වයට අළුත්වැඩියා කරගැනීමට හෝ රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 හි 13.2 වගන්තිය ප්‍රකාරව අපහරණය කිරීමට සමාගම විසින් කටයුතු කළ යුතු බව. |
| (ආ) | වාහන අංක 227-3173 දරන ලොරි රථය 2014 වර්ෂයේ සිට ධාවනයෙන් ඉවත් කර තිබූ අතර, කඩිනමින් අපහරණය කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් දිරාපත් වෙමින් පරිශ්‍රයේ ගාල් කර පැවතුණි. | අදහස් දක්වා නොමැත. | භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල නිර්දේශ මත අප්‍රමාදව අපහරණය කිරීමට කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | අංක 251 – 9413 දරන කැබ් රථය අළුත්වැඩියාව සඳහා 2019 ජූලි 23 දින ගිවිසුමකට එළඹ රු.512,375ක් අත්තිකාරම් ලෙස සේවාදායක ආයතනය වෙත ගෙවා තිබුණ ද අළුත්වැඩියා නොකොට ආයතන පරිශ්‍රයේ ගාල් කර තිබුණි. මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන් නිශ්චය කර අලාභය අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගෙවන ලද අත්තිකාරම් මුදල් නැවත අයකර ගැනීමට හෝ අලුත්වැඩියා කළ හැකි තත්ත්වයේ පවතී නම් ඒ සඳහා වගකිව යුතු නිලධාරින් පියවර ගත යුතු බව. |
| (ඈ) | පිරිවැය රු.මිලියන 05 ක්වූ අංක KH – 5590 දරන කාර් රථය 2022 ජනවාරි 22 දින කොළඹ සිට ගිරිඋල්ල ට පැමිණීමේදී හදිසි අනතුරකට ලක්වූ බව රියදුරු විසින් ප්‍රකාශ කර තිබූ නමුත් එම ගමනේ රාජකාරිමය අවශ්‍යතාවය පිළබඳ හෙළිදරව් කර නොතිබුණි. තවද ඒ සම්බන්ධ පොලිස් වාර්තාවක් විගණනයට ඉදිරිපත් නොවිණි. අනතුරින් වාහනයට පූර්ණ වශයෙන් අලාභහානි වී තිබූ අතර අනතුර සිදුවී වර්ෂයකට ආසන්න කාලයක් ගතවී තිබුණද රක්ෂණ වන්දි ලබා ගැනීමට අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් විගණිත දින වන 2022 දෙසැම්බර් 31 දක්වා රක්ෂණ වන්දි ලබා ගැනීමට නොහැකි වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | ලියකියවිලි ඉදිරිපත් කිරීමේ ප්‍රමාදයට හේතු වූ ගැටලුකාරී තත්ත්වයන් විසඳා කඩිනමින් රක්ෂණ වන්දි අයකර ගැනීමට කටයුතු කළ යුතු බව හෝ එසේ නොමැති නම් වගකිව යුතු පාර්ශ්වයන්ගෙන් අලාභ අයකරගත යුතු බව. |

## 2.8 අවිධිමත් ගණුදෙනු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 සැප්තැම්බර් 27 දින අගමැතිවරයා විසින් ඉදිරිපත් කරන ලද අංක 21/0084/302/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට 2021 ඔක්තෝබර් 26 දිනැති අංක අමප 21/1779/302/002/-1 අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අග්‍රාමාත්‍ය / පස්වන විධායක ජනාධිපති නිල නිවසේ අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අනුමැතිය ලබා දී තිබුණි. මෙම කටයුතු සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සමාගම විසින් සිදු කර තිබුණද මේ සඳහා මූලික ඇස්තමේන්තුවක්, අවශ්‍ය කරන ද්‍රව්‍ය ලැයිස්තුවක්, අවශ්‍ය ප්‍රමාණයන් පිළිබඳ විස්තර හා භාණ්ඩ සැපයීමේ කොන්දේසි,මුදල් ගෙවීම් ආදී කරුණු ඇතුලත් ගිවිසුමකට එළඹ නොතිබුණි. සමාගම විසින් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද වියදම් වාර්තාව අනුව අළුත්වැඩියා හා නඩත්තු කිරීමට අදාළව 2022 නොවැම්බර් 23 දින වන විට සමාගම විසින් නිල නිවසේ අලුත්වැඩියා කටයුතු සඳහා සපයා තිබූ ද්‍රව්‍යවල වටිනාකම රු.267,354,550 ක් වී තිබුණි. මේ තුළ රු.9,976,896 ක වටිනාකමින් යුත් වායු සමීකරන යන්ත්‍ර ,ගෑස් ලයින්, වයිෆයි පද්ධති වැනි | අදහස් දක්වා නොමැත. | වියදම් වාර්තා නිවැරදිව සකස් කළ යුතු අතර ලැබිය යුතු මුදල් නිසි කලට අය කර ගැනීමට කටයුතු කළ යුතු බව. තවද, මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කිරීමටත් ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්ගතවීමටත් ක්‍රියා කල යුතු බව . |

| | | |
|---|---|---|
| සමාගම විසින් සපයනු ලබන ගොඩනැගිලි ද්‍රව්‍යවලට අයත් නොවන වර්ගයේ සැපයුම්ද කර තිබුණි. තවද, විගණන නිරීක්ෂණ අනුව රු. 10,391,979 ක් වූ වියදම් සම්පූර්ණ වියදම තුළට ඇතුලත් කර නොතිබුණු බවද අණාවරණය විය. 2023 මාර්තු 23 දින වන විට අග්‍රාමාත්‍ය කාර්යාලය විසින් පියවා තිබූ මුදල රු.177,122,701 ක් වූ අතර ඒ අනුව තවදුරටත් අයකර ගත යුතු වූ මුදල රු.90,231,848 ක් වී තිබුණි.<br><br>තවද ඉහත අළුත්වැඩියා හා නවීකරණ කටයුතු සඳහා අවශ්‍ය කරන වාස්තු විද්‍යාත්මක, සිවිල් ඉංජිනේරුමය හා අභ්‍යන්තර නිර්මාණ සම්බන්ධයෙන් උපදේශනාත්මක සේවා කටයුතු සමාගමෙන් ලබා ගැනීමට තීරණය කර තිබුණු නමුත් එවැනි උපදේශන සේවා සැපයීම සමාගමේ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තක් නොවන බව නිරීක්ෂණය විය. කෙසේ වුවද, සමාගම විසින් මේ සඳහා බාහිර පුද්ගලයකු එම කටයුත්ත සඳහා තෝරාගෙන තිබූ නමුත් එම පෞද්ගලික සේවා සැපයුම්කරු තෝරා ගැනීමේදී කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාමාර්ගයක් අනුගමනය කර නොතිබුණි. තවද, සේවා කොන්දෙසි ඇතුළත් කිසිදු ගිවිසුමකටද එළඹ නොතිබුණි. 2023 මාර්තු 23 දින වන විට රු.13,073,187 ඒ සඳහා වැයකර තිබුණද, අග්‍රාමාත්‍ය කාර්යාලයෙන් ප්‍රතිපූරණය කර තිබූ මුදල රු.10,000,000 ක් පමණක් වූ අතර තවදුරටත් ප්‍රතිපූරණය කර ගත යුතු වූ මුදල රු.3,073,187ක් විය. | | |
| (ආ) මෙම අළුත්වැඩියා හා නඩත්තු කිරීම්වලට අදාළ භාණ්ඩ මිලදී ගැනීම් සඳහා අනුමැතිය, භාණ්ඩ ඇණවුම් කිරීම් පත්‍ර, භාණ්ඩ මිලදී ගැනීමේ ඉන්වොයිස්, භාණ්ඩ ලැබීම් තුන්ඩු ගෙවීම් වවුචර්වලට අමුණා නොතිබීම හා සමාගම විසින් මිලදී ගත් භාණ්ඩ අදාළ පාර්ශවයන්ට නිවැරදි පරිදි භාර දුන්නේද සහ බාහිර පාර්ශවයන්ට භාණ්ඩ සැපයීම මගින් සමාගමේ සාමාන්‍ය ක්‍රමවේදය අනුව ලබාගත යුතු ලාභාංශික නිවැරදි පරිදි ලබාගන්නේ ද යන්න තහවුරු කිරීමට අදාළ ණය ඉන්වොයිස්පත් හා අදාළ ගැණුම් ඇනවුමේ යොමු අංක විගණනයට ඉදිරිපත් නොවුණි. | අදහස් දක්වා නොමැත. | භාණ්ඩ මිලදී ගැනීම් සම්බන්ධයෙන් නිරීක්ෂණය කළ හැකි ආකාරයට උපකාරක ලිපි ලේඛණ පවත්වාගත යුතු බව. |

## 2.9 අරමුණට පටහැනි වූ ගණුදෙනු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රතිපත්තිමය තීරණ මත ආනයන සීමා කිරීම නිසා වෙළෙඳපොලෙහි පැවති ටයිල් හිඟය අවම කිරීමේ අරමුණින් 2021 ජුනි 11 දිනැති අංක 2231/18 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සෙරමික් ටයිල් ආනයනය කිරීමේ අවසරය මෙම සමාගම වෙත පමණක් ලබාදී තිබුණි. එසේ වුවද ඒ සඳහා මූල්‍ය ශක්තියක් සමාගම සතුව නොමැති වීම හේතුවෙන්, ප්‍රසිද්ධ දැන්වීම් පල කිරීම මගින් | අදහස් දක්වා නොමැත. | ගැසට් පත්‍රයේ අරමුණුවලට අනුකූලව ක්‍රියාකල යුතුය. |

තෝරා ගන්නා ලද එම ව්‍යාපාරයෙහි යෙදී සිටින ආයතන 11ක් සමග "BMC" නාමය යටතේ සෙරමික් ටයිල් ආනයනය කිරීමට සහ 10% ලාභාන්තිකයන් සමාගම වෙත ලැබෙන පරිදි BMC වෙළඳසැල්හිදී අලෙවි කිරීමට ගිවිසුම්වලට එළඹ තිබුණි. ඒ අනුව 2021 සැප්තැම්බර් මාසයේ සිට 2022 සැප්තැම්බර් මාසය දක්වා වූ කාලය තුළ රු. 868,121,891ක (ඇමරිකානු ඩොලර් 3,202,828ක්) වටිනාකමින් යුත් ටයිල් කන්ටේනර් 460ක් ආනයනය කර තිබුණි. මෙම සෙරමික් ටයිල් ආනයනය කර බෙදාහැරීමේ කටයුතු නිරීක්ෂණය, අධීක්ෂණය සහ මග පෙන්වීම සඳහා නිවාස සහ ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමැතිය මත පස්දෙනෙකුගෙන් සමන්විත කමිටුවක් පත්කර තිබුණ ද අදාළ කමිටුවේ නිසි අධීක්ෂණයක් නොවීම හේතුවෙන් ආනයනය කිරීමෙන් වෙළඳපලේ ටයිල් හිඟය අවම වී ජනතාවගේත් සුළු පරිමාණ ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ගේත් යහපතට හේතු වී නොතිබුණු අතරම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ මහා පරිමාණ ව්‍යාපාරිකයන් සීමිත කොටසකට පමණක් මින් වාසි ලැබී තිබුණු බව නිරීක්ෂණය විය.

## 2.10 කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| "ප්‍රමිතියට අනුකූලව උසස් ගුණාත්මකභාවයෙන් යුක්ත ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ තරඟකාරී මිලකට දීප ව්‍යාප්තව සැපයීමේ ප්‍රමුඛයා වීම හා රාජ්‍ය ආයතනයක් ලෙස සමාජ වගකීම් ඉටු කරමින් ශ්‍රී ලංකා ප්‍රජාව තුළ උපරිම විශ්වාසනීයත්වයක් ගොඩනැගීම" ආයතනයේ දැක්ම විය. එසේ වුවද වර්තමානය වන විට ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පවත්වාගෙන යන නවීකරණය කරන ලද ප්‍රදර්ශනාගාරයේ සහ ශාඛා කාර්යාල මගින් පෞද්ගලික ගොඩනැගිලි ද්‍රව්‍ය උපකරණ සපයන්නන්ගෙන් මිලදී ගන්නා ගොඩනැගිලි ද්‍රව්‍ය හා උපකරණ ලාභ ආන්තිකයක් ඇතිව විකිණීමේ යන කටයුතුවල නිරතව පැවතුණි. මේ අනුව සමාගම පිහිටුවීමේ අරමුණු හා සමාගමේ දැක්මද ආවරණය නොවන බව නිරීක්ෂණය විය. එමෙන්ම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන ලද 2013 සිට 2017 දක්වා වූ වර්ෂ 05ක කාලය තුළදී ද ශුද්ධ අලාභය රුපියල් මිලියන 15 සිට රුපියල් මිලියන 86 දක්වා වර්ධනය වී තිබුණි. | අදහස් දක්වා නොමැත. | සමාගමේ අරමුණු හා දැක්ම අනුව කාර්යක්ෂමව හා ඵලදායීව කටයුතු මෙහෙයවීම කළමණාකරණයේ වගකීම වන බව. |

## 2.11 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2021 දෙසැම්බර් 31 දින වන විට සමාගමට එරෙහිව අධිකරණයේ නඩු 06ක් විභාගවෙමින් පැවතුන අතර 2022 ජුනි 30 දින වන විට අධිකරණ නියෝග මත සමාගම විසින් රු.21,762,385ක මුදලක් ගෙවිය යුතුව පැවතුණි. | අදහස් දක්වා නොමැත. | සමාගමට විරුද්ධ නීතිමය කටයුතු අවම වන පරිදි ආයතනයේ කටයුතු මෙහෙයවීමට කළමනාකරණය කටයුතු කළ යුතු බව. |

## 2.12 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1964 අංක 28 දරන ඉඩම් අත්පත්කර ගැනීමේ පනත ප්‍රකාරව 1974.09.09 දින රජයට අයත් ඉඩම් හෙක්ටයාර් 1.1157 සහ රූඩ් 3.2 ක් සමාගමට පවරා දී තිබුණි. අදාළ ඉඩම සමාගම වෙත පවරාදී ඇති සහතික පත්‍රය ප්‍රකාරව මෙම ඉඩම අදාළ අමාත්‍යාංශයේ නිසි අවසරය නොමැතිව අත්පත්කරගත් කාර්යය හැර වෙනත් කාර්යයක් සඳහා නොයෙදිය යුතු වුවත් එයට පටහැණිව අදාල ඉඩමෙන් රූඩ් 04 පර්චස් 31.4 ක් වූ ඉඩම් කැබලි 03 ක් 2005 නොවැම්බර් 14,2007 ජනවාරි 24 හා 2005 අගෝස්තු 14 යන දිනයන්හි HDFC රියල් එස්ටේට් ඩිවලොප්මන්ට් ලිමිටඩ් ආයතනයට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් රුපියල් මිලියන 222.50 කට විකුණා තිබුණි. එසේ වුවද 2012 ජනවාරි 31 දිනට පෙර රු. මිලියන 359.32ක මුදලක් නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව වෙත ගෙවා ඉඩම්වල අයිතිය නිදහස් කර ගැනීමට කොළඹ දිසා අධිකරණයේ නඩු තීන්දුවක් ලබා දී තිබුණත් සමාගම එපරිදි මුදල් ගෙවා ඉඩම්වල අයිතිය ආපසු ලබා ගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | විධිමත් අනුමැතියකින් තොරව ඉඩම් විකිණීම සිදු නොකළ යුතු අතර සමාගම සතු වත්කම් නිසිපරිදි කලමනාකරණය කිරීමට වගබලා ගත යුතු බව. |
| (ආ) | 1998 නොවැම්බර් 09 දින සමාගම විසින් අංක 541 ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 12, පිහිටි සමාගම සතු ඉඩමෙන් පර්චස් 100 ක ප්‍රමාණයක් ලංකා බැංකුව වෙත රුපියල් මිලියන 70කට ඇපකරයක් මගින් පවරා තිබුණු බව සමාගම විසින් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව නිරීක්ෂණය විය. පසුව සමාගම විසින් | අදහස් දක්වා නැත. | අදාළ මුද්දර ගාස්තුව නිසි පරිදි ගෙවා ඉඩමෙහි අයිතිය පවරා ගැනීමට කළමණාකරණය වහා කටයුතු කළ යුතු බව. |

| | | | |
|---|---|---|---|
| | 2018 ඔක්තෝබර් 23 දින භාණ්ඩාගාර ඇපමත ලංකා බැංකුවෙන් ලබා ගන්නා ලද රුපියල් මිලියන 500ක ණය මුදලින් ඉහත විකුණුම්කරයට අදාළ මුදල වන රුපියල් මිලියන 70ක මුදල සහ පොලී මුදලද ඇතුලු එදිනට පැවති අයිරා ශේෂයද සමග ගෙවිය යුතු රු.199,052,329 ක මුදලක් හිලව් කරගෙන තිබුණි. ඒ අනුව ඉඩම නැවත සමගමට පැවරීම සඳහා බැංකුව විසින් සකස් කර එවා තිබූ ඔප්පුවේ වටිනාකමට අදාළ මුද්දර ගාස්තුව වූ රු.5,383,174ක මුදල ගෙවා නැවත ඉඩම පවරාගත යුතු වුවත්, 2021 දෙසැම්බර් 31 දින වන විට වසර 03 ක කාලයක් ගත වූවද පවරා ගැනීම සිදු කර නොතිබුණි. | | |
| (ඇ) | නො. 417/ඒ, කඩේ වීදිය නැගෙනහිර, දුම්රිය පොළ පාර, මාතර යන ඉඩමෙන් රූඩ් 01 පර්චස් 2.8 ක් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් කිසිදු බදු කුලියක් නොගෙවා වර්ෂ ගණනාවක සිට අනවසරයෙන් පරිහරණය කරන අතර සමාගම ඒ සම්බන්ධයෙන් කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදහස් දක්වා නැත. | රාජ්‍ය ආයතන වශයෙන් කළමනාකරණය විසින් සාමූහිකව ගැටළුව විසඳා ගැනීමට හෝ නීතිමය පියවර ගැනීමට කටයුතු කළ යුතු බව. |
| (ඈ) | සමාගම යටතේ ඇති අක්කර 03 රූඩ් 03 පර්චස් 37 ක්වූ ඉඩම්, නිවාඩු නිකේතන, ගබඩා සහ නිවාස 05ක් සඳහා 2022 දෙසැම්බර් 31 දින දක්වාම හිමිකම් ඔප්පු ලබා ගෙන නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නැත. | අදාළ දේපල සම්බන්ධයෙන් හිමිකම් ඔප්පු ලබා ගැනීමට සමාගම ක්‍රියා කළ යුතු බව . |
| (ඉ) | සමාගමට අයත් අක්කර 04 පර්චස් 29.1 ක්වූ ඉඩම් 07ක් සහ නිවාස 05ක් සඳහා මිනින්දෝරු සැලැසුම් සකස් කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | සමාගමට අයත් ඉඩම් හා ගොඩනැගිලි සඳහා මිනින්දෝරු සැලසුම් සකස් කරවා ගැනීමට ක්‍රියා කළ යුතු බව . |
| (ඊ) | 2019 අගෝස්තු 21 වන දිනැතිව සහ අංක අමප/19/2192/122/076 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අංක 549/A, බොරුපන, මොරටුව පිහිටි ඉඩමේ අයිතිය සමාගම වෙත ලබා දීමට අනුමැතිය ලබා දී තිබූ නමුත් සමාගම විසින් ඉඩමේ ඔප්පු සකස් කර අයිතිය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | හිමිකම් ඔප්පුව සකස් කර ලියාපදිංචි කර ගැනීමට සමාගම කටයුතු කළ යුතු බව . |
| (උ) | සමාගම සතුව යාපනය, උප්පුකුලම් කරෙයි කුන්ගනියාර් පිහිටි රූඩ් 01 යි පර්චස් 31.6 ඉඩම, අනුරාධපුර ,පණ්ඩුගම නිවාස, නුවර එළිය බඹර | අදහස් දක්වා නැත. | පවත්නා සම්පත් කාර්යක්ෂමව උපයෝජනයට |

| | | | |
|---|---|---|---|
| | කැලේ ගොඩනැගිල්ල, ඇඹිලිපිටිය යෝධගම නිවාස 02ක් වර්ෂ කිහිපයක සිට උපයෝජනය නොකර නිශ්ක්‍රීයව පැවතුණි.<br><br>තවද, මාතර ලංකා සතොස අලෙවි සැල සඳහා කුලියට ලබා දී තිබුණු සමාගම සතු ගොඩනැගිල්ලක් 2019 ජූලි මස සිට වර්ෂ<br><br>02ට වැඩි කාලයක් නිෂ්ක්‍රීයව තිබුණු අතර නැවත කුලියට ලබා දීමට පියවර ගෙන නොතිබුණි. | | ගැනීමට කටයුතු කළ යුතු බව . |
| (ඖ) | ජාතික ලොතරැයි මණ්ඩලයේ සේවා කටයුතු සඳහා අංක 541, ශ්‍රී සංඝරාජ මාවතේ පිහිටි සංස්ථා පරිශ්‍රයෙහි පිහිටි ගබඩා අංක 1 සිට 7 දක්වා ගබඩා පරිශ්‍ර 7 ක් කුලියට ලබා දී තිබුණි. එම ගිවිසුම අළුත් කිරීමකින් තොරව 2015 වර්ෂයේදී ලබා දී තිබූ මිලටම 2021 වර්ෂය දක්වා එම ගබඩා කුලියට ලබා දී තිබුණු බව නිරීක්ෂණය විය. තවද මෙම ගබඩා සඳහා 2018 ජූලි සිට 2021 ජනවාරි දක්වා ගෙවිය යුතු රු.60,382ක් වූ විදුලි බිල්පත් ජාතික ලොතරැයි මණ්ඩලය විසින් ගෙවා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් තක්සේරුකර විධිමත්ව ගිවිසුම්ගතව පරිශ්‍ර කුලියට දිය යුතු බව. |
| (ක) | 2015 අප්‍රේල් සිට වර්ග අඩියක් රු.45 බැගින් වර්ග අඩි 1480 ක් වූ අංක 541 ශ්‍රී සංඝරාජ මාවතේ සමාගම් පරිශ්‍රයේ සමාගම සතු ගබඩාවක් රු.66,600 ක මාසික කුලියකට පුද්ගලයකු වෙත කුලියට දී තිබුණි. එම ගිවිසුම් කාලය 2017 අප්‍රේල් 09 දිනෙන් අවසන්ව තිබූ අතර නව ගිවිසුමකට එළඹීමකින් තොරව මුල් ගිවිසුම අනුව එකඟ වූ කුලී මුදලටම 2022 දෙසැම්බර් 31 දින දක්වාම එම ගබඩාව නැවත එම පුද්ගලයා වෙතම ලබා දී තිබුණි. | අදහස් දක්වා නොමැත. | වත්කම් තක්සේරු කර ඒ අනුව කුලී ප්‍රමාණය යාවත් කාලීන කර ගබඩාව කුලියට දිය යුතු බව. |
| (ඛ) | ජාතික යොවුන් සේනාංක (National Youth Corps) ආයතනය වෙත රු.164,850 ක මාසික කුලියකට ලබා දී තිබූ රත්මලාන මාලිගාව පාර, පිහිටි ගොඩනැගිල්ල 2019 ඔක්තෝබර් සිට නිෂ්ක්‍රීයව ඇති අතර එම ආයතනයෙන් විදුලි හා ජල බිල්පතට අදාළව අය කර ගැනීමට තිබුණු රු.10,532ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිශ්ක්‍රීය වත්කම් උපයෝජනය කෙරෙහි කලමනාකරණය අවධානය යොමු කළ යුතු බව . |

**2.13 මුදල් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාගම විසින් බැංකු ගිණුම් 12ක් පවත්වාගෙන යනු ලබයි. එසේ වුවද 2021 වර්ෂය සඳහා නිවැරදි ආරම්භක සහ අවසාන ශේෂයන් සඳහන් කරමින් මුදල් පොත් පවත්වාගෙන ගොස් නොතිබුණු අතර බැංකු සැසඳුම් ප්‍රකාශද පිළියෙල කර නොතිබුණි. එම බැංකු ගිණුම් ශේෂ සනාථ කිරීම් අනුව බැංකු ගිණුම් 05ක හර ශේෂය රු. 44,544,272 ක්වූ අතර ගිණුම් 04ක බැර ශේෂය රු. 209,909,046 ක් විය. බැංකු ගිණුම් 03 ක ශේෂ සනාථ කිරීම් ඉදිරිපත් නොවීය. මේ නිසා සමාගම ප්‍රමාණවත් පරිදි මුදල් පිළිබඳ පාලනයක් ක්‍රියාවේ යොදවා නොමැති බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොමැත. | වඩාත් නිවැරදිව ගණනය කර ගත් ආරම්භක ශේෂයක් හෝ පදනම් කර කරමින් මුදල් පොත් සහ බැංකු සැසඳුම් මාසිකව පිළියෙල කිරීමට කටයුතු කිරීමට කළමණාකරණය වහාම කටයුතු කල යුතු බව හා එය මූලා කළමණාකරණය සම්බන්ධයෙන් ඔවුන්ගේ වගකීමක් වන බව |

**3. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ පහත සඳහන් වගන්ති ප්‍රකාරව ආයතනය කටයුතු කර නොතිබුණි.<br>i. 9.2 (ආ) ඡේදය ප්‍රකාරව සමාගම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය තීරණය කර ඒ සඳහා අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.<br>ii. 9.3.1(i) ඡේදය ප්‍රකාරව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත බඳවා ගැනීමේ පරිපාටියක් සමාගම සතුව නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව අනුමත කරන ලද වාර්ෂික අයවැය ලේඛනයක් ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කිරීමට කටයුතු කළ යුතු බව. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති හා අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාරව සමාගමේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 03කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා ඊට අනුරූපීව ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර සෑම මුදල් වර්ෂයක් ආරම්භවීමට දින 15 කට පෙර අදාළ සැලසුම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගත යුතු වුවත් එසේ කර නොතිබුණි. | අදහස් දක්වා නැත. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |